# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 862 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 22/05/2024 පැය 1030

## මාධ්‍ය නිවේදනය

**අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වේ රාජකාරි කරනු ලබන පොලිස් නිලධාරියෙකු ලෙස පෙනී සිටි සැකකරුවෙකු අත්අඩංගුවට- කඩවත පොලිස් ස්ථානය.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රාජකාරි කරනු ලබන පොලිස් පරීක්ෂකවරයෙක් ලෙසට ව්‍යාජ ලෙස පෙනී සිටිමින් කඩවත පොලිස් වසමේ පදිංචි කාන්තාවකට මිනී මැරුම් චෝදනා ඇති බවටත් ඒ සම්බන්ධව විමර්ශනය කරනු ලබන නිලධාරියා තමන් බව පවසමින් එම කාන්තාවගෙන් රුපියල් 25000.00 ක මුදලක් ඉල්ලා සිටින බවට ලැබී ඇති පැමිණිල්ලක් සම්බන්ධව විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඒ අනුව බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාසයේ නිලධාරින්ට ලද තොරතුරකට අනුව කඩවත පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රාජකාරි කරනු ලබන පොලිස් පරීක්ෂකවරයෙක් ලෙසට ව්‍යාජව සකස් කරන ලද හැඳුනුම්පතක් ද සමඟ මෙම සැකකරු 2024.05.21 වන දින සවස් කාලයේදී කඩවත පොලිස් වසමේදි අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන කන්දේ මුදියන්සේලාගේ පැතුම් ප්‍රසාද් ජාමික නැමති මාබිම, හෙයියන්තුඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඩවත පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**